# <u>උහන ප්‍රාදේශීය සභාවේ පැවති 07 වන සභා වාරයේ පනස් අටවන සභා රැස්වීම් වාර්තාව</u>

දිනය ඃ- 2023.01.12 පෙ.ව. 10.00

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6. | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 7. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 10. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 17. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 18. | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 19. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 20. | එන්. අමරකීර්ති මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 21. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 22. | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 23. | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 24. | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 25. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 26. | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 27. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

| | | |
|---|---|---|
| 1. | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 2. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

01.ආගම සිහිකිරීම හා මියගිය රණ විරුවන් සිහිකිරීම

ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහි කිරීමෙන් පසු පෙ.ව.10.00 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

රැස්වීම ආරම්භයේදී ගරු මන්ත්‍රීවරුන් 16 දෙනෙක් පැමිණ සිටින ලදී.

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 6. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 13. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 15. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

**02.පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාගත කර ඇති පරිදි ස්ථිර කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.05 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී පී.ඒ.අයි.සන්ධ්‍යා පලිහක්කාර මිය හා ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී.සුගන්ධි ෂාවිකා මිය පැමිණෙන ලදි.


**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා විසින් සභා වාර්තාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත සභා වාර්තාව සම්මත විය.**

**03.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන -**

**ගරු සභාපතිතුමා.**

නො.422/1 එකමුතුගම උහන ලිපිනයේ පදිංචි එච්.එම්. ප්‍රසාද් කුමාර මහතා විසින් එම ග්‍රාමයේ පදිංචි කරුවන් 16 දෙනෙකුගේ අත්සන් සහිතව අබලන් වූ බෝක්කුවක් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්,එය සභාගත කරන බව ප්‍රකාශ කරන ලදි.



එම්.එච් ප්‍රසාද් කුමාර
නො. 422/1,
එකමුතුගම,
උහන.
2023/01/09

සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන.

අබලන් වූ බෝක්කුවක් පිළිසකර කර ගැනීම සඳහා


සභාපතිතුමනි,

එකමුතුගම අප ග්‍රාමයේ නො. 405/1 නිවස අසළ මාර්ගයේ බෝක්කුව කැඩී ගොස් ඇත. එම නිසා එම මාර්ගයේ ගමන් ගන්නා පිරිසට දැඩි අපහසුතාවයට පත් වී ඇති බැවින් එම බෝක්කුව කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

| නම | ලිපිනය | අත්සන |
|---|---|---|
| M.H. ප්‍රසාද් කුමාර | 422/1, එක්මුතුගම, උහන. | [signature] |
| R.B.C. කුමාරි | 459, එක්මුතුගම, උහන | [signature] |
| S.C. කොඩිකාර | නො 466 A, " | [signature] |
| P.P.G. රානුක ප්‍රියන්ත | NO 405, [illegible] එක්මුතුගම, උහන | [signature] |
| M.G.K.S. විජේරත්න | 407/A එක්මුතුගම පාලම් හන්දිය, උහන. | [signature] |
| W.A. සුරංජිත් | 438 පාලම්හන්දිය, උහන | [signature] |
| M.G. [illegible] | 407/2 " " | [signature] |
| A.G. ධම්මිකා කුමාරි | 407 " " | ධම්මිකා |
| H.M. [illegible] ජයවර්ධන | 432 " " | [signature] |
| L.Y.G. ජනක කුමාර ජයසූරිය | 418/එක්මුතුගම උහන | Shavindi |
| L.Y.G. ජයසූරිය | 408 එක්මුතුගම, උහන | ජයසූරිය |
| K.W. [illegible] | 447 එක්මුතුගම උහන | [signature] |
| K. [illegible] | 405/2/1, එක්මුතුගම. උහන | [signature] |
| M.K. [illegible] | 405/2. එක්මුතුගම. | [signature] |
| G.G. [illegible] | 448, එක්මුතුගම | [signature] |
| A.H.G.M. ලක්මාලි | 403/1, එක්මුතුගම. | [signature] |

**ගරු සභාපතිතුමා.**

පුස්තකාල සේවක ලෙස සේවය කර 2022.12.31 දිනෙන් සේවයෙන් විශ්‍රාම ගන්නා ලද කේ.එච්.ජී.සරෝජනී මානෙල් මිය විසින් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ලිපියක් යොමුකර ඇති බවත් , එම ලිපිය සභාගත කරන බවත් ප්‍රකාශ කරන ලදි.


ප්‍රාදේශීය සභාව
12 JAN 2023
උහන.

කේ. එච්. ජී සරෝජනී මානෙල්
නො: 292.
මහ විද්‍යාල පිටුපස
උහන.

2023.01.12

ගරු සභාපතිතුමා / ලේකම් තුමිය.
ප්‍රාදේශීය සභාව
උහන.

ගරු සභාපතිතුමනි,

කොන්ත්‍රාත් පදනම මත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීම.

මා අවුරුදු 28 ක් උහන ප්‍රාදේශීය සභාවට අයත් ගෝනාගොල්ල හා උහන මහජන පුස්තකාල පුස්තකාල සහායක ලෙස සේවය කර 2022.12.31 දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

මා දැනට යහපත් සෞඛ්‍ය තත්වයෙන් පසුවන බැවින් මාගේ සේවය තව දුරටත් උහන මහජන පුස්තකාලය වෙත කොන්ත්‍රාත් පදනම මත ලබා දීමට කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට,
විශ්වාසී,

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.10 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.12 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.ජී.චතුරංග දර්ශන කුමාර මයා හා ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.එම්. මාලක මිහිර බංඩාර මයා පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

අවුරුදු 28 ක් ඇය මේ සභාවේ සේවය කල සේවිකාවක් බවත් , නොයෙක් ප්‍රශ්න , ගැටළු හමුවේ වුවද එම සේවාව කරගෙන පැමිණි බවත් , ඇයට හැකි පමණින් මෙම සභාවට සේවයක් ලබාදුන් බව මා විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදි.එම ඉල්ලීම පිළිබඳ ගැටළුවක් නොමැති බවත් , කොන්ත්‍රාත් ක්‍රමයට බඳවා ගැනීමේදී ඒ සඳහා වැටුපක් අප ලබා දිය යුතු බවත් , එවිට අපගේ අයවැය ලේඛණයේ කොතනක හෝ එම මුදල තිබිය යුතු බවත් පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා.**

මෙය අප සභාවෙන් වැටුපක් ගෙවන ක්‍රමයකට නොව පලාත් පාලන සහකාර කොමසාරිස් හරහා පලාත් පාලන කොමසාරිස් තුමාට යොමු කර එයට අදාල චක්‍රලේඛ වලට අනුකූලව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලීමක් සිදු කරන බව ප්‍රකාශ කරන ලදි.දේශපාලන මතවාද අප සමග තිබුනත් රාජකාරියේදී අප සමග සුහදව කටයුතු කල බවත් , එම ලිපිය ඔබ සියළු දෙනාගේ අදහස් ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

එසේ සිදුවනවානම් එම කටයුත්තට එකග බව ප්‍රකාශ කරන ලදි.නීත්‍යානුකූලව කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීමට සභාවට බලය තිබෙන බවත් , නමුත් එතනින් එහාට වැටුප් ගෙවීම ආදිය සභාව විසින් භාරගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.සේවක හිඟයක් මේ සභාව තුළ තිබෙන බැවින් ඇයට කොන්ත්‍රාත් පදනම මත සේවා දිගුවක් කරගැනීමට හැකිදැයි කටයුතු සිදුකර බලන ලෙසත් ඒසඳහා පූර්ණ අනුමැතිය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි.එසේ සේවා දිගුවක් සිදුකර නොදී සභාවෙන් වැටුප් ගෙවීමට පැවසුව හොත් ඉන් එහාට ගන්නා තීන්දුවත් මේ අවස්ථාවේදිම කතා කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

මෙම ලිපිය පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස් තුමාට යොමුකර එහි ප්‍රගතිය සභාවට ඉදිරිපත් කිරීම සිදුකරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මයා.**

එතුමිය මගෙනුත් මේ පිළිබඳව ඉල්ලීමක් කල බවත් , සානුකම්පිතව කෙනෙකුට උදව්වක් කිරීම වෙනම කාරණයක් බවත් , අපි මේවා කතාකරන විට පුද්ගලයන් තරහ වන බවත් , නමුත් ප්‍රතිපත්ති වෙනස් කරන්නට බැරි බවක් මට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.අපේ හිටපු සභාපතිතුමා ගැන මා පුදුම වන බවත්, මේ පිළිබඳව කතා කිරීමේදී එතුමාගේ අදහස පුදුම සහගත බවත් , පසුගිය දිනවල සභාවට සේවයක් කල පුහුණුවූ දරුවෙකුට මාස හයක් සඳහා කාලය දීර්ඝ කරන්නට අනුමැතිය ඉල්ලූ අවස්ථාවේ මෙතුමා විරුද්ධ වූ බවත් , දැන් මෙයට කැමැත්ත ප්‍රකාශ කරන බවත් , මෙසේ ප්‍රතිපත්ති වෙනස් වෙන්නේ කෙසේද යන්න ගැටළුකාරී බවත් ප්‍රකාශ කරන ලදි.සානුකම්පිතව බැලිය යුතු බව සත්‍ය බවත් , එතුමිය මා සමගත් ඉතා හිතවත් බවත් , නමුත් සභාවෙන් තීරණයක් අරගෙන තිබෙනවානම් ඒ ස්ථාවරයේ සිටිය යුතු බව

පෙන්වා දෙන ලදි.එක එක්කෙනා වෙනුවෙන් එක එක තීන්දු නොගෙන පොදුවේ තීන්දුවක් ගැනීමට හැකියාව තිබෙනවානම් එය හොඳ යැයි කියන මතයේ මම සිටින බවත් ප්‍රකාශ කරන ලදි.පුද්ගලයාගෙන් , පුද්ගලයාට තීන්දු තීරණ ගැනීමේදී හිතවත්කම් මත විශාල ගැටළුවක් වියහැකි බවත් පෙන්වා දෙන ලදි.සාමාන්‍යයෙන් අධ්‍යාපනය ලබන දරුවෙක් යම් ඉල්ලීමක් කලවිට එය අංක එක විය යුතු බවත් , මාගේ හැටි එහෙම බවත් ප්‍රකාශ කරන ලදි.අපි ඒ වේලාවේ විරුද්ධ වී මේ අවස්ථාවේ අනුමැතිය ලබා දීම ගැටළු සහගත බව පෙන්වා දෙන ලදි.එතුමිය විශ්‍රාම යාම තුලින් සභාවේ කාර්යයන් , අඩපණ වීමක් සිදුවනවා නම් එතුමිය බඳවාගෙන කටයුතු කලාට මාගේ ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කරන ලදි.තව ඉදිරියට මෙවැනි කාර්යයන් තිබෙනවානම් පොදුවේ තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.20 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඩබ්.රාණිමැණිකේ මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ දෙය සත්‍ය බවත් , පසුගිය අවස්ථාවේ එම සිදුවීමට මම තරයේ විරුද්ධ වූ බවත්, එම දරුවා මාස 06 ක පුහුණුවීමක් ලබා එම පුහුණුව නැවත මාස 06 කින් දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටි බවත් , මෙතුමිය එසේ නොව රජයේ වැටුප් ලැබූ ඇය අද දින ප්‍රථම වතාවට කොන්ත්‍රාත් පදනම යටතේ මාස 06 කට සේවා දිගුවක් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදි.ඇය මාස 06 කට පමණක් සේවා දිගුව ඉල්ලා සිටින බවත් , ඊට අමතරව කොන්ත්‍රාත් පදනමින් ගත්විට මුදලක් ගෙවීම සිදුවන්නේ සභාවෙන් බවත් , නමුත් ඇයට එසේ සභාවෙන් මුදල් ගෙවීමක් සිදු කිරීමක් නොවන බවත් , එම නිසා මා එයට අකමැත්ත ප්‍රකාශ කල බවත් පැහැදිලි කරන ලදි. සභාපතිතුමා පැවසූ ආකාරයට පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් , පළාත් පාලන කොමසාරිස්ට ලිපි යොමුකර මේ කටයුත්ත රජයෙන් වැටුප් ගෙවිය හැකි ආකාරයට සකස්කර ගැනීමට කටයුතු කරන බව පැහැදිලි වූ හෙයින් අපට මෙයට අකමැති වීමට කාරණාවක් නොමැති බවත් , මෙය සභාවට බරක් නොවන බවත් , සභාවට මෙය සහනයක් බවත් , එම නිසා මෙයට එකඟ වූ බව පැහැදිලි කරන ලදි.මෙතන අද කතා කරන්නේ පුහුණු නිළධාරිනියක් ගැන බවත් , එදා කතා කලේ පුහුණු වෙන්න එන නිළධාරියෙක් ගැන බවත් ප්‍රකාශ කරන ලදි.පුහුණු වෙන්න එන නිළධාරියෙක් නිතර නිතර පුහුණු විමට ගියහොත් වෙන කාටවත් පුහුණු වීමට නොහැකිවන බවත් පෙන්වා දෙන ලදි.මෙතනදී අපගේ සේවා අවශ්‍යතාවය මත බඳවා ගැනීමක් බව පැහැදිලි කරන ලදි.කැමති තීන්දුවක් සභාවට ගතහැකි බව ප්‍රකාශ කරන ලදි.සභාවට පාඩුවක් වෙන ආකාරයට මම කවදාවත් වචනයක් වත් කතා කර නැති බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.ඒ.අයි.සන්ධ්‍යා පලිහක්කාර මිය.**

ඔබතුමා පැවසූ පරිදිම එතුමිය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම පිලිබඳ මාගේ කිසිදු අකමැත්තක් නැති බවත් , මොකද මා අත්වින්ද දෙයක් පිලිබඳ ප්‍රකාශ කලයුතු බව පැහැදිලි කරන ලදි.ගොනාගොල්ල පුස්තකාලය කියවීමට පාඨකයන් නොගිය ස්ථානයක් බවත් , කලින් නිළධාරීන්ගේ ක්‍රියා කලාප අනුව සත්‍ය එය බවත් , උහන ප්‍රාදේශිය සභාවෙන් ලබාදුන් පොත් ටිකත් පැත්තකට දමා එයවත් පිළිවෙලට සකස් නොකර සිටි නිළධාරීන් සිටි බවත් , මම කිහිප අවස්ථාවකම ගොස් පොත් ටික පිළිවෙලට ගොනුකර තබන්නට යැයි ප්‍රකාශ කල බවත් ,එයවත් සිදු නොකල නිළධාරීන් සිටි බවත් , නමුත් මෙම මානෙල් මහත්මිය දවසක් මමත් සිටින තැනම එතුමිය එම වේලාවේම සභාවට කතා කර සභාවේ සේවකයින් ගෙන්වා ගෙන පොත්ටික පිලිවෙලට රාක්කගත කල බවත් , එම අවස්ථාවේම ළමා පොත් ටික තියෙන්නේ කෙසේද ආදී ලෙස ස්ථාන ගත කල බවත් , ලස්සනට පිලිවෙලට සකස්කලේ ඇය බවත් ප්‍රකාශ කරන ලදි.වසර ගනනාවක් සිටි නිළධාරියා සිටිද්දී ඇය කාර්ය ශූරව එම කටයුත්ත කල බවත් , ඒවා අගය තල යුතු බවත් , එය අගය කිරීමට අද දින මා නැගී සිටිය බවත් ප්‍රකාශ කරන ලදි.දැන් ගොනාගොල්ල පුස්තකාලය ප්‍රිය මනාප ස්ථානයක් වී ඇති බවත් , අළුතින් පත්කර ඇති නිළධාරීතුමිය ඉතා හොඳ බවත් පෙන්වා දෙන ලදි.පාඨකයොත් දැන් විශාල වශයෙන් පැමිනෙන බවත් පෙන්වා දෙන ලදි.කියවීමට රුචි , පාඨකයන්ට ඇවිත් ඉන්න පුළුවන් ස්ථානයක් කරන්න , මූලිකත්වය ගත්තේ , මූලික අඩිතාලම දැම්මේ එතුමිය බව ප්‍රකාශ කරන ලදි .එතුමිය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව සභාවේ රඳවා ගැනීම සිදුකල හැකිනම් මමත් එයට එකඟ බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.25 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්.ජගත් ප්‍රසන්න මයා හා ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්. අමරකීර්ති මයා පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී කේ.වී.ජී. නයනා කුමුදුනී මිය.**

උහන පුස්තකාලය ඉතා හොදට කරගෙන යන බවත් , පුස්තකාලය පිළිබඳ පුහුණුවක් ලබපු , පුහුණු නිළධාරියෙක් ලෙස ඇය ඉතා හොදට පුස්තකාලය පවත්වාගෙන ගිය බවත් , එවැනි නිළධාරිණියක් ආරක්ෂාකර ගැනීම අපගේ යුතු කමක් බවත් , පුස්තකාලයට නවක සේවකයෙක් බඳවා ගන්නවාට වඩා ඇය පුහුණු නිළධාරිණියක් බැවින් , පුහුණු සේවකයෙක්ගේ සේවය අපට ලබාගත හැකිනම් එය සභාවටත් ලැබෙන ලොකු වාසියක් ලෙස මා දකින බවත් පැහැදිලි කරන ලදි.ස්ථිර සේවකයෙක් ලෙස වසර 28 ක් වැනි කාලයක් සේවය කරපු නිළධාරිණියක් එම නිසා ඇය යම් ක්‍රමවේදයකට නැවත සේවය දිගුවක් ලබා දිය හැකිනම් ඒ සඳහා සම්පූර්ණ කැමැත්ත ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි. සභාපතිතුමා පවසා සිටි ආකාරයට පලාත් පාලන සහකාර කොමසාරිස් මගින් පලාත් පාලන කොමසාරිස්ට යොමු කර එම ක්‍රමවේදයට කොන්ත්‍රාත් පදනම මත සේවය දිගුවක් ලැබෙනවානම් සභාවට එය වාසියක් බවත් , ඇයගේ මෙම ඉල්ලීමට මාගේ පූර්ණ කැමැත්ත ලබාදෙන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඩබ්.රාණි මැණිකේ මිය.**

නයනා මන්ත්‍රීතුමිය පැවසූ දේ සත්‍ය බවත් , මෙවැනි පුහුණු නිළධාරිණියකට නැවත සේවා දිගුවකින් කොන්ත්‍රාත් පදනම මත ලබා ගැනීමට හැකියාව ඇත්නම් සභාවට එය වාසි සහගත බවත්, එම නිසා එතුමියගේ එම ඉල්ලීමට මාගේද කැමැත්ත ප්‍රකාශ කර සිටින බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා.**

දිගින් දිගටම මේ ගැන කතා කිරීම සිදු කිරීම අත්‍යාවශ්‍ය බවත් , මීට මාස තුනකට හෝ හතරකට පෙර විදුලි කාර්මික හා අනෙකුත් කම්කරුවන් බඳවා ගැනීම සඳහා සභා තීන්දුවක් ගත් බවත් , නමුත් මේ මොහොතේ මැතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති නිසා බඳවා ගැනීම් සිදුකිරීමට හැකියාවක් නොමැති කමක් ඇති බවත් ප්‍රකාශ කරන ලදි.රැකියා ලක්ෂයේ සේවකයන් ස්ථිර කිරීමටත් , සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයන් ස්ථිර කිරීම සඳහාත් අනුමැතිය ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදි .බඳවා ගැනීම් වලදී වැටුප් ගෙවීමට හැකියාව තිබෙනවාද නැද්ද යන්න දන්නේ සභාපතිවරයා බවත් , එම නිසා මම සේවකයින් බඳවා නොගත් බවත් ප්‍රකාශ කරන ලදි.ඔවුන්ට වැටුප් ගෙවීමට සභාවේ මුදල් නොතිබූ නිසා ඔවුන්ව බඳවා නොගත් බවත් පැහැදිලි කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.30 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී.ජයතිලක මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.32 ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා පැමිණෙන ලදි.

**04.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.55 ගරු ප්‍රා.ස.මන්ත්‍රී උඩවෙල ධම්මතිලක හිමි පැමිණෙන ලදි.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න සභාවට ඉදිරිපත් කිරීම**

ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් අසනු ලබන ප්‍රශ්නාවලිය සභා ගත කිරීම

ආර්.ඩබ්. ඒකනායක,
ප්‍රාදේශීය සභා මන්ත්‍රී,
ප්‍රාදේශීය සභාව,
උහන.
2022.12.27

ප්‍රාදේශීය සභාව
27 DEC 2022
උහන.

ලේකම්තුමිය,
ප්‍රාදේශීය සභාව,
උහන.

12/109

**ප්‍රාදේශීය සභාවේ සභා රීති 10.1 යටතේ නඟනු ප්‍රශ්නාවලිය**

ලේකම්තුමියනි.

ඉහත මාතෘකාව යටතේ උහන ප්‍රාදේශීය සභාව වෙත පහත අංක අනුව ඉදිරි සභාවේ වාචික සහ ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් මෙය ඉදිරිපත් කරමි.

01. උහන ප්‍රාදේශීය සභාව වෙත PT1 (දෙවන අදියර) සහ PT2 සඳහා යොමු කොට ඇති අරමුදල් සම්බන්ධයෙන් PT2 අදියර ව්‍යාපෘතිය යටතේ කරනු ලබන ඉදිකිරීම් සඳහා සභාවේ අනුමැතිය ලබා ගෙන තිබේද?
02. එසේ නම් ඒ කවදාද?
03. එසේ නම් මෙම ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුව ලබාදුන් ආකාරය කවරේද?
04. එය ලබාදුන් අය පිළිබඳ විස්තරය
05. උහන ප්‍රාදේශීය සභාවේ BT2 BT3 යන ව්‍යාපෘතිය යටතේ උහන පොදු වෙළඳපල සඳහා ලබාදුන් අරමුදල් මේ වන විට ඉවත් කරගෙන යන බව දැන ගැනීමට ඇත. එය සත්‍යක්ද?
06. උහන ළමා උද්‍යානය අසල කරනු ලබන ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව ගත් තින්දු තිරණ මොනවාද? ඒ සඳහා සභාව වෙත යොමු කළ ඇති ලේඛන සභාගත කරන්න
07. උහන ප්‍රාදේශීය සභාව සතු PE-8373 දරණ කැබ් රථයේ කාර්මික දෝෂය සම්බන්ධයෙන් අවශ්‍ය නිලධාරීන් දැනුවත් කර තිබේද? ඒ කවදාද?
08. උහන ප්‍රාදේශීය සභාව විසින් ස්ථාපනය කරනු ලැබූ සූර්ය විදුලි පුවරු සමනබැද්ද පිරිවෙන අසල සිට අලි පල්ලම ප්‍රදේශය දක්වා ස්ථාපනය කර තිබූ බවත් වෙන විට එම පද්ධතිය ගලවා ඉවත් කර ඇති බවත් මේ සඳහා සභාව ගත් තින්දු තිරණ කවරේද? ඒ කවදාද?

ඉහත කාරණා සම්බන්ධයෙන් අදාල කටයුතු සඳහා ඉදිරි සභා වාරයේදී කරුණු ඉදිරිපත් කරන මෙන් ඉල්ලමි.

**රංජිත් ඒකනායක**
**ප්‍රාදේශීය සභා මන්ත්‍රී (හිටපු සභාපති)**
**ප්‍රාදේශීය සභාව - උහන**
**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ**
**0777 907880**

ආර්.ඩබ්. ඒකනායක,
ප්‍රාදේශීය සභා මන්ත්‍රී

# උහන ප්‍රාදේශීය සභාව
## UHANA PRADESHIYA SABHA
## உஹன பிரதேச சபை

මගේ අංකය: / My No. / எனது இல: UPS/Secretary/Com/2023

ඔබේ අංකය: / Your No / உம இல:

2023.01.12

ආර්.ඩබ්. ඒකනායක,

ප්‍රාදේශීය සභා මන්ත්‍රී,

ප්‍රාදේශීය සභාව,
උහන.

**<u>ප්‍රාදේශීය සභාවේ සභා රීති 10.1 යටතේ නගපු ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු</u>**

ඉහත මාතෘකාව යටතේ උහන ප්‍රාදේශීය සභාව වෙත පහත අංක අනුව ඉදිරි සභාවේ වාචික සහ ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් මෙය ඉදිරිපත් කරමි.

01. උහන ප්‍රාදේශීය සභාව වෙත PT1 (දෙවන අදියර) සහ PT2 සඳහා යොමු කොට ඇති අරමුදල් සම්බන්ධයෙන් PT2 අදියර ව්‍යාපෘතිය යටතේ කරනු ලබන ඉදිකිරීම් සඳහා සභාවේ අනුමැතිය ලබා ගෙන තිබේද?

- **නැත**
- **එසේ වුවත් PT 1 2nd අදියර (50%) ව්‍යාපෘතියේ යෝජනා පහත පරිදි වේ.**
  01. **වාහන සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා අවශ්‍ය සේව උපකරණ මිලදී ගැනීම.**
  02. **උහන ළමා උද්‍යානය සඳහා උපකරණ මිලදී ගැනීම හා කුටි ඉදිකිරීම.**

**සංවර්ධන ව්‍යාපෘති තුලින් ඉහත කාර්යන් සිදු කිරීම සම්බන්ධව පෙර සභා වල සාකච්ඡා කර ඇත. එබැවින් මෙම යෝජනා PT 1 (50%) යටතේ සිදු කිරීමට අදාල ව්‍යාපෘති අංශ වෙත යොමු කරන ලදි. එම ව්‍යාපෘති සඳහා අනුමැතිය ලැබී ක්‍රියාත්මක කිරීමට සහා තීරණය ගැනීමට සභාව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. නමුත් සභා අනුමැතිය ලබා ගැනීමට යටත්ව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලබා දී ඇති කාල සීමාව පිළිබඳ ගැටළුවක් ඇති හෙයින් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි. මේ පිළිබඳ 2022.12.23 දින පැවති මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේදී වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානය ඉදිකිරීම සම්බන්ධව කොන්ත්‍රාත්තුව ලබා දීම පිළිබඳ තීරණය ලබා දෙන ලදි.**

02. එසේ නම් ඒ කවදාද? -

03. එසේ නම් මෙම ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුව ලබාදුන් ආකාරය කවරේද?

- **එම ඉදිකිරීම සඳහා 2022.12.23 පැවති මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේදී සාකච්ඡා කළ අතර, එහිදී ප්‍රජා මූල සමිතියක් මඟින් සිදු කිරීමට තීරණය කළ අතර, උහන නගරයේ ප්‍රජා මණ්ඩලය සක්‍රිය තත්වයේ නොමැති හෙයින් ආසන්න ප්‍රජා මණ්ඩලය වන පාලම් කඳවුර සමනබැද්ද එකමුතු ප්‍රජා මණ්ඩලය මඟින් අදාල කොන්ත්‍රාත්තුව සිදු කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදි.**

තවද ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් පරීක්ෂා කර කොන්ත්‍රාත්තුව සිදු කිරීම සඳහා සක්‍රිය ප්‍රජා මණ්ඩලය ලෙස ඉහත සඳහන් ප්‍රජා මණ්ඩලය තෝරා දෙන ලදි. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් එම ප්‍රජා මණ්ඩලය සමඟ ගිවිසුම්ගතව අදාල කටයුතු ආරම්භ කරන ලදි.

04. එය ලබාදුන් අය පිළිබඳ විස්තරය

- **පාලම් කඳවුර සමනබැද්ද එකමුතු ප්‍රජා මණ්ඩලය**

05. උහන ප්‍රාදේශිය සභාවේ BT2 BT3 යන ව්‍යාපෘතිය යටතේ උහන පොදු වෙළඳපල සඳහා ලබාදුන් අරමුදල් මේ වන විට ඉවත් කරගෙන යන බව දැන ගැනීමට ඇත. එය සත්‍යක්ද?

**පොළ ඉදිකිරීම සම්බන්ධව ටෙන්ඩර් කිරීම ආදිය සිදු කරන ලද්දේ CLG කාර්යාලයෙන් වන අතර, එහි ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ගත් අවසාන තීරණය අප වෙත ලිඛිතව යොමු කර නොමැති අතර, ඒ සඳහා වෙන්වූ ප්‍රතිපාදන ඉවත් කරගෙන යන්නේද සම්බන්ධව මා නොදන්නා අතර 2022.11.17 දින එන්. ඩබ්. ජයසේකර කාර්මික නිලධාරිතුමිය හා එම්.අයි. අබ්දුෂ් සලාම් කාර්මික නිලධාරිතුමා ඉංජිනේරුතුමා සමඟ දුරකතනයෙන් සාකච්ඡා කර ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි 2022.11.18 දින නැවත ඇස්තමේන්තුවක් සකස් කර විද්‍යුත් තැපැලයෙන් යොමු කර ඇත.**

06. උහන ළමා උද්‍යානය අසල කරනු ලබන ඉදිකිරීම් සම්බන්ධයෙන් සභාව ගත් තින්දු තිරණ මොනවාද? ඒ සඳහා සභාව වෙත යොමු කළ ඇති ලේඛන සභාගත කරන්න.

- **ළමා උද්‍යානය ඉදිකිරීම සම්බන්ධව ඍජු ශ්‍රමය යටතේ සිදු කිරීමට කටයුතු කරන ලදි.**

07. උහන ප්‍රාදේශිය සභාව සතු PE-8373 දරණ කැබ් රථයේ කාර්මික දෝෂය සම්බන්ධයෙන් අවශ්‍ය නිලධාරීන් දැනුවත් කර තිබේද? ඒ කවදාද?

- **යාන්ත්‍රික ඉංජිනේරුතුමා වෙත 2022.12.28 යොමු කර වාර්තා ලබා ගෙන අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදි.**

08. උහන ප්‍රාදේශිය සභාව විසින් ස්ථාපනය කරනු ලැබූ සූර්ය විදුලි පුවරු සමනබැද්ද පිරිවෙන අසල සිට අලි පල්ලම ප්‍රදේශය දක්වා ස්ථාපනය කර තිබූ බවත් වෙන විට එම පද්ධතිය ගලවා ඉවත් කර ඇති බවත් මේ සඳහා සභාව ගත් තින්දු තිරණ කවරේද? ඒ කවදාද?

- **කෙටි කාලයක් තුල දිගින් දිගටම විදුලි පහන් කණු කපා සොරුන් විසින් රැගෙන යාම සිදු විය. මේ හේතුවෙන් සභාව විසින් සත්කාරිය වෙනුවෙන් කළ වියදම් අපතේ යන බව පෙනුනි. එබැවින් සභාව වෙත ඉදිරිපත් කර තිරණ ගැනීමට කාලයක් නොමැති වූ අතර, නැවත සොරුන්ට පහසුවෙන් කණු කපීමට නොහැකි වන ලෙස ක්‍රමවේදයන් යොදවා නැවත මෙම සූර්ය විදුලි පුවරු සවි කිරීමේ අදහසින් මෙම කනු සහිත සූර්ය විදුලි පුවරු සභාව වෙත නැවත ගෙන එන ලදි.**

ලේකම්,
ප්‍රාදේශිය සභාව,
උහන.

කාර්යාලය ෆැක්ස් ඊමේල්

**ගරු සභාපතිතුමා.**

05 වන ප්‍රශ්නයේ පිළිතුරට වැඩියමක් ලෙස පොලෙහි මුදල් කිසිම හේතුවකින් නැවත ගිහින් නැති බවත් , නැගෙනහිර පලාත් සභාවේ එය තිබෙන බවත් , එහි චක්‍රලේකයක් පමණක් නිකුත් කර ඇති බවත් , ඉදිකිරීම් කටයුතු සිදු කරන්නට එපා යැයි එහි සඳහන්ව ඇති බවත් , 2022.04.25 මුළු රටේම තීන්දුවක් අරගෙන ඇති බවත් , ඒ සමගම විමලවීර දිසානායක ඇමතිතුමා ගිය සතියේ කොළඹ අමාත්‍යාංශයේදී මුන ගැසී කතා කල බවත් ප්‍රකාශ කරන ලදි. එහිදී ජනාධිපතිතුමා පවසා සිටියේ ලෝක බැංකු ආධාර යටතේ ලැබුණු මුදල් නිසා ඒ පිළිබඳ සාකච්ඡාවක් ජනවාරි 05 ලබා දුන් බවත් , නමුත් එම සාකච්ජාව අත් හිටවූ බවත් ප්‍රකාශ කරන ලදි.ඒ කෙසේ වෙතත් එම මුදල් තවම ගිණුමේ තිබෙන බවත් , ඒවා කෙසේ හෝ ලබාගෙන පොළ සෑදීමට කටයුතු කරමින් සිටින බව ප්‍රකාශ කරන ලදි.PT 2 ව්‍යාපෘතිය යටතේ යෝජනා ලබාගත් බවත් ,පළමුවෙනි යෝජනාවට අපි යොමුකලේ කෘෂි උපකරණ සහ බීජ ලබා දීම බවත්, එහිදී යම් ගැටළුවක් මතුවී ඇති බවත් ,මුල් මාස 04 දී එය ඉවර කල යුතු බවත්, මැතිවරණයක් ප්‍රකාශ කර ඇති මොහොතක ඒ භාණ්ඩ බෙදා දීමට බැරි වුව හොත් ඒ මුදල් වියදම් කරන්නට හැකියාවක් නොමැති බව පලාත් පාලන සහකාර කොමසාරිස් දුරකතනයෙන් දැනුම් දුන් බව ප්‍රකාශ කරන ලදි.ඒ සඳහා මිලියන 18 වැනි මුදලක් වෙන්වී ඇති බවත් , පරණ පොළ අලුත් වැඩියා කිරීම සුදුසු බවත් , කඩ කාමර ටිකක් හෝ එම මුදලින් හදන්නට පුළුවන් වුනොත් ඉතා හොඳ බවත් ප්‍රකාශ කරන ලදි.ඒ සඳහා සභා තීරණයක් අරගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.පලාත් පාලන සහකාර කොමසාරිස් තුමා උහන ප්‍රදේශයට ආසන්න ගමක ජීවත් වන බැවින් උහන ප්‍රදේශයට යමක් කිරීමට එතුමාට අවශ්‍යතාවය පවතින බැවින් , සභාව පිටුපස වාහන සේවා මධස්ථානය හා ළමා උද්‍යානය හදා ගැනීම සඳහා මා එතුමාගෙන් ඉල්ලීමක් කල බවත් එතුමා එයට අනුමැතිය ලබාදුන් බවත් ප්‍රකාශ කරන ලදි. විදුලි පහන් කනු දිගින් දිගටම හොරුන් විසින් කපාගෙන යන අවස්ථාවේ සමාජ මාධ්‍ය ජාලයෙන් පවා දැනුවත් කර ඒ සඳහා උදව් ඉල්ලා සිටි බවත්,පොලිසියේ පැමිණිලි හතරක් දැමූ බවත් ,ප්‍රකාශ කරන ලදි.රු.75000.00 විදුලි පහන් කනු 06ක් සොරුන් විසින් කැපූ බවත් ප්‍රකාශ කරන ලදි. විදුලි බල මන්ඩලයේ විදුලි රැහැන් නැති ස්ථානයක අපි විසින් සද්භාවයෙන් කරන ලද මේ ක්‍රියාදාමය මේ ආකාරයට විනාශ කිරීම ගැන දුකක් පවතින බවත් ප්‍රකාශ කරන ලදි.මේ සභාවේ දේපලක් ,මේ සභාවේ වත්කමක් මෙසේ විනාශ වීමට දිය නොහැකි නිසා එම විදුලි පහන් කනු 28 ක් සභාවට ගලවා ගෙන ආ බවත් ප්‍රකාශ කරන ලදි.දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කල බවත් , විදුලි බල මණ්ඩලයෙන් කනු 30 ක් ලබා දෙන ලෙස තීරණය වූ බවත් , එලෙස විදුලි බල මණ්ඩලයෙන් ලබාදෙන කොන්ක්‍රීට් කණු උඩ ඒවා සැකසීමට කටයුතු යොදන බවත් ප්‍රකාශ කරන ලදි.ඒ අනුව විදුලි ඉංජිනේරු තුමාට කතා කල බවත් ,ලේකම් තුමිය විසින් ලිඛිතව එතුමාට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් විදුලිබල මණ්ඩලයෙන් අවශ්‍යය කනු ලැබුණු වහාම නැවත ඒවා සවි කිරීමට අවශ්‍යය කටයුතු සිදුකරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ප්‍රාදේශිය සභා රීති 10/08 යටතේ මාවිසින් නගපු ප්‍රශ්නාවලියට ලිඛිතව හා වාචිකව පිළිතුරු ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුති වන්ත වන බවත් , නමුත් සමහර ප්‍රශ්න වලට පිළිතුරු ලැබී ඇති බවත් ,සමහර ප්‍රශ්න වලට පිළිතුරු අසම්පූර්ණ බවත් පෙන්වා දෙන ලදි.එතන ගැටළුවක් තිබෙන බවත් , එය සභා ගත කරන ලෙස ලේකම් තුමියගෙන් ඉල්ලීමක් කරන බවත් ප්‍රකාශ කරන ලදි.මම මේ ප්‍රශ්නාවලිය ඉදිරිපත් කලේ මේ තුළින් යම් යම් ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට බවත් ප්‍රකාශ කරන ලදි.වාහන සේවා මධ්‍යස්ථානයක් යන එක අපි සභාවේ ලියාපදිංචි කිරීමේදී අප්‍රිය ජනක ව්‍යාපාර ලෙස ගැසට් කර ඇති බවත් , එයට බලපත්‍රයක් ලබා දීමට මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ගතයුතු බවත්,නීත්‍යානුකූල ක්‍රමවේදය එය බවත් ප්‍රකාශ කරන ලදි. අපි මෙය අපේ අවශ්‍යතාවයක් නිසා ඉදිකිරීම සිදු කරන බවත්. නමුත් නීතිමය තත්වයක් පැන නගීවි යැයි කවුරුවත් නොසිතුව බවත් , නමුත් කවුරුහරි මෙයට විරුද්ධව කටයුතු කලොත් කුමක් කරන්නේදැයි විමසන ලදි. මෙහි අනර්ථය කාට හෝ බලපෑ හැකි බව පවසා ඉහලට දැනුම් දී කටයුතු සිදු කල හොත් සැලැස්ම ඉවත් කර ගැනීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි.මධ්‍යම පරිසර

අධිකාරියේ අවසරය ලබා ගැනීම අනිවාර්ය බවත් මෙම සේවය කර පෙන්වා අවසරය ලබා ගතයුතු බව පැහැදිලි කරන ලදි.එවිට ප්‍රශ්න පැන නගීවි යැයි ද එසේ ගැටළුවක් නොවී මේ මුදල් වැය කර කටයුතු සිදු කිරීම මාගේ මේ කතාවෙන් උත්සාහ ගත් බව ප්‍රකාශ කරන ලදි.ළමා උද්‍යානය අසල ඉදිකිරීමේදී උපකරණ අරගෙන සවි කිරීම පිළිබද අප කවුරුවත් විරුද්ධ ඔතන ඔය ඉස්සරහ ඉන්න පුද්ගලයන්ගේ පිරිවිතයන් අප විසින් ශුද්ධකර පුරවා අරගෙන ඇති බවත් ,නමුත් එතන එක එක ඉදිකිරීම් කිරීමට ඉඩදිය නොහැකි බවත් පෙන්වා දෙන ලදි.එසේ කරන්නට ගියොත් අර කියන මිනිසුන්ටත් අසාධාරණයක් වන බවත් , අප විසින්ද කර ඇත්තේ අනවසර ඉදිකිරීමක් බව පෙන්වා දෙන ලදි.ඒ නිසා ඒ වැඩයට යන්න එපා කියන යෝජනාව මා විසින් ගෙන එන බව ප්‍රකාශ කරන ලදි.තවද ඔබතුමාගේ වාහනය පිළිබද එහි යම් ප්‍රශ්ණයක් , යම් දෝෂයක් වි ගරාජ් එකට දමා ඇති බවත් , එයට නියම ක්‍රමවේදයකට ගොස් නැති බවත් , මා මේ ප්‍රශ්නාවලිය නැගූ පසු ඔබතුමා 2022.12.28 දින මෝටර්රථ ඉන්ජිනේරුතුමා දැනුවත් කර ඇති බව ප්‍රකාශ කරන ලදි.එය එසේ හෝ කිරීම පිළිබද මා ස්තුති වන්ත වන බවත් , එසේ සිදු නොවුනා නම් අපි නැවත ප්‍රශ්නයකට පැටලෙන බව ප්‍රකාශ කරන ලදි.මොකද හේතුව ඔබතුමා වාහනය හැදූපසු මුදල් ගෙවා පැමිණියද මොනම තැනක වත් සභා අනුමැතියක් වත් ඒ සදහා නොමැති බව ප්‍රකාශ කරන ලදි.එසේ වූවාට පසු ඔඩිට් එකට එය හසුවූ පසු මේ ලක්ෂ ගණන ගෙවීමට අපි බැදී සිටින බව ප්‍රකාශ කරන ලදි.එම නිසා නිවැරදි ක්‍රමවේදයකට යොමුවීම පිළිබද ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි.මේ ප්‍රශ්නාවලියෙන් මා බලාපොරොත්තු වූයේ මේ සභාව යම් වැරදි පැත්තකට යොමු වී යනවා නම් එය වලක්වා නිවැරදි මාර්ගයට ගැනීම බව ප්‍රකාශ කරන ලදි.දැන් එම ප්‍රශ්න ටික එකින් එක ලිහිල් වී නිවැරදි තැනට එය පැමිණ ඇති බව ප්‍රකාශ කරන ලදි.උහන පොදු වෙළද පොළ සම්බන්ධව දෙතුන් පාරක් මුදල් පැමිණ එම මුදල් නැවත ගිය බවත් ප්‍රකාශ කරන ලදි. හදිසි අවශ්‍යතාවයකදී 11/08 යටතේ හදිසි සභාවක් කැදවීමට ඔබතුමාට පනතින් බලය ලබා දී ඇති බවත් , මේ ආකාරයට සූර්ය පැනල ප්‍රශ්නයේදී ඔබතුමාට හදිසි සභාවක් කැදවා තීරණයක් ගැනීමට තිබුනා නේදැයි විමසන ලදි.යම් පුද්ගලයකුට යම් කරදරයක් වී ඔහු විසින් ඒ පිළිබද පැමිණිල්ලක් දැම්මොත් , එයට මුහුණ දීම සදහා එම විදුලි පැනල ගැලවීමට තීරණයක් ගත් ආකාරය පෙන්වීමට හැකියාව තිබිය යුතු බව ප්‍රකාශ කරන ලදි.යම් පුද්ගලයෙක් විදුලි පහන් තිබෙනවායැයි සිතා පාරේ ගමන් කිරීමේදී අලි පහර දීමක් සිදුවූවායැයි සිතමු.එම පුද්ගලයා ඒ සම්බන්ධව සභාවට විරුද්ධව පැමිණිල්ලක් යොමු කලහොත් , වෙනදා තිබූ විදුලි පහන් කණු මේ දිනයේ නොතිබුන බවත් , වෙනදා ලෙස විදුලි පහන් කණු ඇති යැයි සිතා පාරේ ගමන් ගත් බවත් ,එම විදුලි පහන් කණු නොමැති නිසා අලි පහර දීමකට සිදු වූවායැයි පවසා , එම පහන් කණු ගැලවීම සම්බන්ධව චෝදනා කර වන්දි ඉල්ලා සිටිය හොත් , එම කණු ගැලවීමට ගත් තීරණය පිළිබද විමසීමේදී සභා තීරණයක් හෝ තිබිය යුතු බව ප්‍රකාශ කරන ලදි.මේ කණු ඉවත් කිරීමට බලය දුන්නේ කවුරුන්දැයි විමසුවොත් කුමක් සිදු කරනවාදැයි විමසන ලදි.අපි හොද වැඩ කරන්නට ගොස් නඩු දෙක තුනක් වැටී ඇති බවත් ,ඒ ආකාරයට යම් තීන්දුවක් ගත් අවස්ථාව සදහන් විය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.ඔබතුමාට තීන්දු ගත හැකි බවත් , නමුත් ඔබතුමාට මන්ත්‍රීවරු 11 දෙනෙකු හෝ කැදවා සණපූර්ණය ලබාගෙන හදිසි යෝජනාවක් දමා මේ කණු ඉවත් කිරීම සිදු වූවානම් ඔබතුමා නිදහස් බව ප්‍රකාශ කරන ලදි.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා සභාවට ඉදිරිපත් කිරීම**

**යෝජනා අංක 06/2023/01(01)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්, ආදායම් පරීක්ෂක තනතුරේ රාජකාරී ආවරණය කරනු ලබන ඩබ්.ඒ. විජේකුමාරතුංග මහතා ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නිරතවන බැවින් ඒ සදහා ඉන්ධන වියදම් දීමනාවක් ලබාදෙන ලෙස ඉල්ලුම් කලද පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් එම දීමනාව සදහා අනුමැතිය ලබා නොදුන් අතර ඔහුට ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සදහා මසකට පැය 100 ක අතිකාල දීමනාවක් ලබා දීම සදහා සභාවේ අනුමැතිය සදහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්. කරුණාසේන දයාතිලක මයා විසින් ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මසකට පැය 100 ක් අතිකාල සිදු කල නොහැකි බැවින් පැය 80 ක් අනුමැතිය ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.ආදායම් එකතු කිරීමට නිළදාරීන් තුන්දෙනෙකු සිටින බැවින් කොට්ඨාශ තුන බෙදාදී හෝ අපට ප්‍රගතියක් පෙන්විය යුතු බව ප්‍රකාශ කරන ලදි.මේ මාසයේ වැඩ කලාට වඩා අතිකාල අරගෙන වැඩ කරන විට ආදායම වැඩිවන නිසා එහි ප්‍රගතියක් පෙන්විය යුතු බව ප්‍රකාශ කරන ලදි.ඒ ප්‍රගතිය පෙන්වීම තුලින් මෙතුමාට අතිකාල ලබා ගතහැකි බව පැහැදිලි කරන ලදි.ඊලග මාස තුනට නැවත අනුමැතිය ලබා ගැනීම සඳහා අනිවාර්යයෙන් ප්‍රගතිය පෙන්විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ.දෙලංකාවල මයා.**

මසකට පැය 100 ක් ඉල්ලුවාට පැය 80 ක් පමණක් අනුමැතිය ලැබුණු බවත් අප මෙසේ පැවසුවාට එතුමා අතින් වියදම් කරගෙන ගොස් මේ කාර්ය සිදුකල නොහැකි බවත් , අනිත් නිළධාරීන්ට හිමිවන වරප්‍රසාද මොහුට හිමි නොවන්නේ ඔහුගේ තනතුරේ වෙනස්කම නිසා බවත් පැහැදිලි කරන ලදි.එම නිසා අතිකාල දීමනා පැය 80 මුදලත් සමග ඔහුට වියදම් වන මුදල අතර සාධාරණයක් තිබෙනවාද යන්න සොයා බැලිය යුතු බවත් ,ඔහුට සාධාරණයක් ඉටුවිය යුතු බව පැහැදිලි කරන ලදි.ඔහුගේ අතින් විශාල මුදලක් වැය වනවා නම් එම ආදායම් එකතු කිරීම එතනදීම අඩාල වන බව පැහැදිලි කර දෙන ලදි.ඊලග මාසයේදී ඒ ගැන සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදි. ඔහුට ගෙවන එම අතිකාල මුදල ගැලපෙනවාදැයි සොයා බැලිය යුතු බව පෙන්වා දෙන ලදි.

**මසකට පැය 80 ක අතිකාල දීමනා අනුමත කිරීම සඳහා සභාවෙන් තීරණය විය**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/01(02)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්, PT 1- 2 අදියර (50%) ව්‍යාපෘතියේ පහත සඳහන් යෝජනා සභා අනුමැතිය ගැනීමට යටත්ව යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

01. වාහන සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා අවශ්‍යය සේවා උපකරණ මිලදී ගැනීම .
02. උහන ළමා උද්‍යානය සඳහා උපකරණ මිළදී ගැනීම හා කුටි ඉදි කිරීම .

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඊ.ආර්.සුමනාවතී මිය විසින් ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත එම යෝජනාව ඒකමතිකව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් ප.ව. 11.20 තේ විවේකය සඳහා සභාව කල් තබන ලදි

ඔරලෝසු වේලාවෙන් ප.ව. 11.40 තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදි.

**07. කාරක සභාවල වාර්තා -**

**2022.12.06 දින පැවති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව හා 2022.12.23 දින පැවති මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාගත කරන ලදි.**

**<u>2022.12.06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව</u>**

සහභාගිත්වය

01. ගරු සභාපතිතුමා - ටී.පී. උපුල් ප්‍රියන්ත මහතා - සභාපති
02. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - රංජිත් වනිගසිංහ මහතා - සාමාජික
03. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය - සාමාජික
04. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මහතා- සාමාජික
05. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - ඒ. නන්දිකා ප්‍රියන්ති මිය - සාමාජික

කාර්ය මණ්ඩලය

1. පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය - ලේකම් ප්‍රා.ස.
2. ඩබ්.එස්.ආර්. කුමාරී මිය - ප්‍රධාන කළ.සේවා නිල.
3. ඩබ්.සී.ඒ. ගලේවෙල මිය - සංවර්ධන නිලධාරී
4. එස්.එස්. වික්‍රමසූරිය මිය - කළමනාකරණ සේවා නිලධාරී
5. ඩී.එම්. තිස්ස කුමාර මයා - ආදායම් පරීක්ෂක
6. එම්.ඩී.කේ.ඩබ්. ගුණතිලක මහතා - ආදායම් පරීක්ෂක

මෙදින මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම තුල 2023 වර්ෂය සඳහා උහන කඩ කාමර නව තක්සේරුව අනුව ප්‍රසම්පාදනය කිරීම සඳහා සාකච්ඡාවට මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවට අමතරව පහත සඳහන් මන්ත්‍රීවරුන්ද සහභාගි කර ගන්නා ලදි.

01. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - ඩී.ඒ. දෙලංකාවල මහතා
02. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - එන්. අමරකීර්ති මහතා
03. ගරු ප්‍රා.ස. මන්ත්‍රී - ඩබ්. රාණි මැණිකේ මිය

02. උහන නගරයේ පිහිටි සභාවට අයත් කඩ කාමර නව තක්සේරුවට අනුව 2023 වර්ෂයට අදාලව ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධයෙන් පළමුව කමිටුව සාකච්ඡා කරන ලදි. මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා වූ අතර, පළමුව ගිවිසුම උල්ලංඝනය කර සිටින බදුකරුවන් හදුනා ගත යුතු බවත්, එහිදී ග්‍රාම නිලධාරී, ආදායම් පරීක්ෂක හා පොලිස් නිලධාරී මහතෙකු මඟින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර නිත්‍ය බදුකරුවන් හා අතුරු බදුකරුවන් කවුරුන්ද යන්න හදුනා ගෙන ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර කඩ කාමර සභාව වෙත පවරා ගත යුතු බව ප්‍රකාශ කරන ලදි. කඩ කාමර ප්‍රසම්පාදනය කිරීමේදී නිත්‍ය බදුකරුවන් විසින්ම කඩ කාමරය පවත්වා ගෙන යන්නේ නම් ඔවුන්ට යම් සහනයක් සැලසිය යුතු බවත්, ගිවිසුම් උල්ලංඝනය කළ බදුකරුවන්ට ප්‍රසම්පාදන ක්‍රමවේදය මත කඩ කාමර බදු දීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදි. උහන කඩ කාමර අංක 20 හි බදුකරු වන පී. චාන්දනී දමයන්ති මිය පිලිකා රෝගය හේතුවෙන් දැඩි ලෙස රෝගාතුරව සිටින අතර, ඇය විසින් කඩ නොකර නොකඩවා කඩ කුලී ගෙවීම හේතු කොට ගෙන අංක 20 කඩ කාමරය විවෘත කිරීම සඳහා මාස 03 ක සහන කාලයක් ලබා දීමට කමිටුව තිරණය කළ අතර, එම කාලය තුල කඩ කාමරය විවෘත කිරීමට නොහැකි වුවහොත් ප්‍රසම්පාදනය කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

03. එසේම කඩ කාමර ප්‍රසම්පාදනය කිරීමේදී කඩ කාමර තැම්පත් මුදල ලෙස කඩ කාමර වලට නියමිත තක්සේරු වටිනාකම මාස තුනකට අදාල මුදල එකවර අයකර තැම්පත් මුදල ලෙස අයකිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදි.

04. විනෝද බදු අයකිරීම සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් දිර්ඝ ලෙස සාකච්ජා කළ අතර, එහිදි 15 % ක ප්‍රතිශත මුදලක් විනෝද බදු ලෙස අය කිරීම සුදුසු බවත්, එම ප්‍රතිශත මුදල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනිමට යොමු කර අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට නිර්දේශ කරන ලදි. එසේම එම ප්‍රතිශත මුදල සඳහා අනුමැතිය ලැබෙන තුරු එම අතර කාලය සඳහා ප්‍රදේශයේ ලියාපදිංචි සංගිත කණ්ඩායම් (ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශිය සභාව මඟින්) සඳහා රු. 15,000.00 ක මුදලක් අය කිරීම සුදුසු බවත්, ප්‍රසිද්ධ සංගිත කණ්ඩායම් තුළින් රු. 35,000.00 ක මුදලක් අය කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් විසින් නිර්දේශ කරන ලදි.

05. උහන ප්‍රාදේශිය සභාව මඟින් ප්‍රදේශයේ පාසල් දරුවන් සඳහා බැංකු, ආයතන හා ප්‍රජා සමිති වල ආධාර ලබා ගෙන අධ්‍යාපන සම්මන්ත්‍රනයක් සහා අනුමැතියට යටත්ව පැවැතිවිමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

සභාපති,
ප්‍රාදේශිය සභාව,
උහන.

සභාපති
ඩී.ඒ. උපුල් ප්‍රියන්ත
ප්‍රාදේශීය සභාව
උහන.

## 2022.12.23 දින පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

සහභාගීත්වය ගරු ප්‍රා.ස. මන්ත්‍රීන්:-

| | | | |
|---|---|---|---|
| 01 ගරු සභාපති | - | ටි.පී. උපුල් ප්‍රියන්ත මහතා | - සභාපති |
| 02 ගරු උප සභාපති | - | එච්.එම්. ජගත් දේශප්‍රිය මහතා | - සාමාජික |
| 03 ගරු ප්‍රා.ස. මන්ත්‍රී | - | රංජිත් ඒකනායක මහතා | - සාමාජික |
| 04 ගරු ප්‍රා.ස. මන්ත්‍රී | - | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මහතා | - සාමාජික |
| 05 ගරු ප්‍රා.ස. මන්ත්‍රී | - | ඒ. නන්දිකා ප්‍රියන්ති මිය | - සාමාජික |

කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| 01 පී.ඒ.අයි.අයි. මැණිකේ මෙය | - ලේකම් ප්‍රාදේශීය සභාව උහන |
| 02 ඩබ්.එස්.රේණුකා කුමාරි මිය | - කළ.සේවා නිලධාරි |
| 03 ඒ.යූ. දේදුනු තරංගා මිය | - සංවර්ධන නිළධාරි |
| 04 ආර්.ජී. ගයානි අනුරුද්ධිකා මිය | - සංවර්ධන නිළධාරි |

මෙදින මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම තුල වාහන සේවා මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීම සම්බන්ධව දිර්ඝ වශයෙන් සාකච්ජා කළ අතර, එහිදී උහන නගරයේ ප්‍රජා මණ්ඩලය සක්‍රිය තත්වයේ නොමැති හෙයින් ආසන්න ප්‍රජා මණ්ඩලය වන පාලම්කඳවුර සමනබැද්ද එකමුතු ප්‍රජා මණ්ඩලය මඟින් අදාල කොන්ත්‍රාත්තුව සිදු කිරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදි. එහිදී LDSP PT 01 50% ක ව්‍යාපෘතියට අදාලව ප්‍රසම්පාදන කමිටු වාර්තා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පරීක්ෂා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
උහන.

සභාපති
ටී.පී. උපුල් ප්‍රියන්ත
ප්‍රාදේශීය සභාව
උහන.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.11.45 ට ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමාට මූලාසනය භාර දී සභාවෙන් පිටවී යන ලදි.

## ආදායම් විග්‍රහය -2022 දෙසැම්බර්

| | | | | |
|---|---|---|---|---|
| 01. පොදු පරිපාලන | වරිපනම් | රු: | 153,348.79 | |
| | ව්‍යාපාර බදු | රු: | 28,800.00 | |
| | බයිසිකල් | රු: | | |
| | විවිරේබා සහතික | රු: | 6,000.00 | |
| | වරිපනම් දඩ | රු: | | |
| | වරිපනම් දඩ/උසාවි දඩ | රු: | | |
| | පොලී | රු: | | |
| | පෝරම ගාස්තු | රු: | 1,090.00 | |
| | අභ්‍යන්තර බිල්කිරීම් | රු: | 1,038,515.00 | |
| | සේවක ණය පොලී | රු: | 11,431.00 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 2,656,829.59 | |
| | **එකතුව** | රු: | | **3,896,014.38** |
| 02.සෞඛ්‍ය සේවා | වෙළඳ බලපත්‍ර | රු: | 8,000.00 | |
| | පරිසර බලපත්‍ර | රු: | | |
| | පරිසර බලපත්‍ර පරීක්ෂාව | රු: | 4,000.00 | |
| | සුනඛ එන්නත් | රු: | | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 345,855.79 | |
| | **එකතුව** | රු: | | **357,855.79** |
| 03.භෞතික සැලසුම් | ගෙවල් කුලී | රු: | | |
| | කුලියට දීම (වාහන) | රු: | 88,000.00 | |
| | කුලියට දීම් (භූමිය) | රු: | 3,000.00 | |
| | දීර්ඝ කාලීන බලපත්‍ර | රු: | 1,000.00 | |
| | ගොඩනැගිලි පරීක්ෂාව | රු: | | |
| | සැලසුම් ශිල්පින් ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු: | | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | 9,000.00 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 397,791.61 | |
| | **එකතුව** | රු: | | **498,791.61** |
| 04.ජල සේවා | ජල බවුසරය | රු: | | |
| | නල ළිං | රු: | | |
| | **එකතුව** | රු: | | - |
| 05.උපයෝගී සේවා | කඩකාමර කුලී (උඟන, වැරැන්කැටගොඩ) | රු: | 184,592.85 | |
| | මස්කඩ | රු: | | |
| | පොල බදු | රු: | 114,320.00 | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | පොළ/කඩකාමර ප්‍රමාද ගාස්තු | රු: | 12,744.95 | |
| | **එකතුව** | රු: | | **311,657.80** |
| 06.සුභසාධන සේවා | විනෝද බදු | රු: | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු | රු: | | |
| | ගවයන් ඇල්ලීම | රු: | | |
| | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | රු: | 20.00 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 133,770.00 | |
| | **එකතුව** | රු: | | **133,790.00** |
| 07.විදුලිය | වැටුප් ප්‍රතිපූරණය | රු: | | |
| | **එකතුව** | රු: | | - |
| | පුනරාවර්තන ආදායම් එකතුව | | | **5,198,109.58** |
| | ප්‍රාග්ධන ආධාර | | 1,718,617.00 | **1,718,617.00** |

| | | | | |
|---|---|---|---|---|
| | එකතුව | | | 6,916,726 |
| වෙනත් ලැබීම් | පුස්තකාල තැන්පත් | රු: | 760.00 | |
| | සේවක ණය | රු: | 100,250.00 | |
| | විවිධ තැන්පත් | රු: | 204,076.00 | |
| | ටෙන්ඩර් තැන්පත් | රු: | | |
| | මුද්දර තැන්පත් | රු: | 2,250.00 | |
| | වැටුප් තැම්පත් | රු: | | |
| | අත්තිකාරම් පියවීම | රු: | 37,100.00 | |
| | මුදල් මාරු | රු: | 1,915,035.00 | |
| | ණය ගැති | රු: | | |
| | එකතුව | රු: | | 2,259,471.( |
| | මුළු එකතුව | | | 9,176,197.5 |

සකස් කලේ :-

පරීක්ෂා කලේ:-

ලේකම්
ප්‍රාදේශීය සභාව,
උහන.

පී.ඒ.අයි. ඉරෝෂණී මැණිකේ
ලේකම්
ප්‍රාදේශීය සභාව
උහන.

## උහන ප්‍රාදේශිය සභාවේ මාසික ඒකාබද්ධ වැය සාරාංශය
## 2022 දෙසැම්බර් මාසය

| | | | |
|---|---|---|---|
| 1 | අතිකාල ගෙවීම | | |
| | 01. ඒ. ප්‍රියන්ත කුමාර මයා (2022 නොවැම්බර් මස පැය 60 ක් සඳහා) | 6,999.60 | 12/10 |
| | 02. ආර්.කේ.ජේ.වික්‍රමසිංහ මයා (2022 නොවැම්බර් මස පැය 60 ක් සඳහා) | 7,497.00 | 12/07 |
| | 03. එච්.ඊ. සරත් කුමාර මයා (2022 නොවැම්බර් මස පැය 60 ක් සඳහා) | 6,687.00 | 12/11 |
| | 04. කේ.පී. සුගත් සමරවීර මයා (2022 නොවැම්බර් මස පැය 41.5 ක් සඳහා) | 4,495.69 | 12/08 |
| | 05. ඩබ්.ඒ. අමින්ද තුසිත මයා (2022 ජුනි මස පැය 18.30ක් සඳහා) | 2,542.82 | 12/152 |
| | 06. කේ. රාසනායගම් මයා (2022 දෙසැම්බර් මස පැය 20 ක් සදහා) | 2,333.20 | 12/176 |
| | 07. වී.ඒ. අජිත් කුමාර මයා (2022 දෙසැම්බර් මස පැය 20 ක් සදහා) | 2,062.40 | 12/175 |
| | 08. ඊ. ඉලංකෝ මයා (2022 දෙසැම්බර් මස පැය 20 ක් සදහා) | 2,354.00 | 12/177 |
| | 09. එම්. ක්‍රෂ්ණන් මයා (2022 දෙසැම්බර් මස පැය 20 ක් සඳහා) | 2,499.00 | 12/178 |
| | 10. කේ.පී. සුගත් සමරවීර මයා (2022 දෙසැම්බර් මස පැය 60 ක් සඳහා) | 6,562.20 | 12/198 |
| | 11.ඒ. වික්‍රමරත්න මයා (2022 දෙසැම්බර් මස පැය 20 ක් සඳහා) | 2,187.40 | 12/199 |
| | 12. එල්. රසික සම්පත් (2022 දෙසැම්බර් මස පැය 20 ක් සඳහා) | 2,187.40 | 12/200 |
| | 13.ඒ. ප්‍රියන්ත කුමාර මයා (2022 දෙසැම්බර් මස පැය 60 ක් සඳහා) | 6,999.60 | 12/201 |
| | 13. ආර්.කේ.ජේ.වික්‍රමසිංහ මයා (2022 දෙසැම්බර් මස පැය 60 ක් සඳහා) | 7,497.00 | 12/202 |
| | 14.එච්.ඊ. සරත් කුමාර මයා (2022 දෙසැම්බර් මස පැය 60 ක් සඳහා) | 6,687.00 | 12/203 |
| 2 | ජල බිල්පත් පියවීම | | |
| | 01.ගොනාගොල්ල පොදු වෙළඳපොළ (2022.10.24-2022.11.30/2022.11.25-2022.12.29 දක්වා ) | 5,206.07 | 12/131 |
| | 02.වැරැන්කැටගොඩ පොදු වෙළඳපොළ (2022.11.03 දක්වා ) | 1,652.63 | 12/126 |
| | 03.වැරැන්කැටගොඩ පොදු වෙළඳපොළ (2022.11.03-2022.12.04) දක්වා ) | 4,331.28 | 12/127 |
| | 04.උහන පොදු වැසිකිලිය (2022.11.09-2022.12.09) | 1,193.70 | 12/124 |
| | 05.උහන පොලිසිය අසල ජල කරාමය (2022.11.03-2022.12.04) | 639.40 | 12/125 |
| | 06.වීරගොඩ පොළ (2022.10.23-2022.11.23) | 356.50 | 12/128 |
| | 07.නුගේලන්ද පොළ (2022.11.14-2022.12.13) | 616.40 | 12/129 |
| | 08.උහන පොදු වෙළද පොළ මාළු ලැල්ල(2022.11.07-2022.12.07) | 4,404.50 | 12/130 |
| | 09.උහන ප්‍රධාන කාර්යාල ජල බිල්පත (2022.11.08-2022.12.09) | 6,776.57 | 12/132 |
| 3 | දුරකථන බිල්පත් පියවීම | | |
| | 01. 0632030900 ( 2022.11.01-2022.11.30 දක්වා ) | 6,851.17 | 12/139 |

| | | | |
|---|---|---|---|
| 4 | **විදුලි බිල්පත් පියවීම** | | |
| | 01. වීරගොඩ නව පුස්තකාලය (2022 ඔක්තොම්බර් මස) | 369.24 | 12/19 |
| | 02. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.11.07-2022.12.03) | 446.16 | 12/134 |
| | 03. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.11.18-2022.12.19) | 828.00 | 12/135 |
| | 04. ගොනාගොල්ල නිල නිවස (2022.11.07-2022.12.03) | 123.08 | 12/136 |
| | 05. උහන ප්‍රධාන කාර්යාලය (2022.11.29-2022.12.30) | 24,053.34 | 12/137 |
| | 06. උහන මහජන පුස්තකාලය (2022 නොවැම්බර් මස) | 1,343.59 | 12/17 |
| | 07. උහන මහජන පුස්තකාලය (2022.11.29-2022.12.30) | 1,285.30 | 12/138 |
| | 08. මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම (වැරැන්කැටගොඩ අංක 14 කඩ කාමරය විදුලි බිල්පත පියවීම) | 8,773.08 | 12/179 |
| | 08. මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම (වැරැන්කැටගොඩ අංක 16 කඩ කාමරය විදුලි බිල්පත පියවීම) | 10,377.79 | 12/180 |
| | 09.වීරගොඩ නව පුස්තකාලය (2022.11.27-2022.12.23 දක්වා) | 497.42 | 12/193 |
| | 10. මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම (වැරැන්කැටගොඩ අංක 15 කඩ කාමරය විදුලි බිල්පත පියවීම) | 7,046.15 | 12/195 |
| | 11. වීරගොඩ නව පුස්තකාලය (2022 නොවැම්බර්) | 369.24 | 12/18 |
| 5 | **ගමන් වියදම්** | | |
| | 01.ඒ.යු. දේදුනු තරංගා මිය (කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන) | 1,876.00 | 12/149 |
| | 02.එන්.ඩබ්. ජයසේකර මිය (කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන) | 2,268.00 | 12/148 |
| | 03. ආර්.පී.පී.ඒ. විජේසිංහ මිය (කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන) | 1,876.00 | 12/150 |
| | 04. එස්.ආර්. කුමාරි මිය (කාර්යාල ක්‍රම හා සංස්කරණ සේවා වැඩසටහන) | 1,980.00 | 12/196 |
| 6 | **පරිවර්ථිත ගමන් වියදම්** | | |
| | 01. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 මාර්තු මාසය සඳහා) | 5,000.00 | 12/144 |
| | 02. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 අප්‍රේල් මාසය සඳහා) | 5,000.00 | 12/145 |
| | 03. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 ජුලි මාසය සඳහා) | 5,000.00 | 12/146 |
| | 04. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 අගෝස්තු මාසය සඳහා) | 5,000.00 | 12/147 |
| | 05. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 සැප්තැම්බර් මාසය සඳහා) | 5,000.00 | 12/182 |
| | 06. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 ඔක්තොම්බර් මාසය සඳහා) | 5,000.00 | 12/183 |
| | 07. ඩී.එම්. තිස්ස කුමාර දසනායක (2022 නොවැම්බර් මාසය සඳහා) | 5,000.00 | 12/184 |
| 7 | 01. ඒ.පී.ප්‍රදීප් පත්මචන්ද්‍ර මයා (2022 නොවැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 20,212.51 | 12/21 |
| | 02. ටී.පී.ඩී. හේමමාලි රණවීර මිය (2022 නොවැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 21,610.13 | |
| | 03. එච්.එම්. ප්‍රදීප් සඳකැලුම් මයා (2022 නොවැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 22,589.33 | |
| | 04. ඩී.එම්. දිලාන් තනුජ මයා (2022 නොවැම්බර් මස දෛනික වැටුප් ගෙවීම) | 20,816.01 | |
